# සාදු සාදු සාදු
# සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!
# (කළුතර බෝධි පරිශ්‍රයේ පවත්වන දේශනාවක් හා සබැඳියි)

අපි අපේ මුළු ජීවිත කාලය පුරාම සොයන , සපුරාගන්න උත්සහකරන එක්තරා ධර්මතාවක් තියෙනවා, කුමක්ද ඒ දෙය , ඒ ධර්මතාව.......ඒකතමයි සතුට ,සැපය, සොම්නස් බව. තවත් නනාවිධ වු වචන වලින් මෙම අදහස විස්තර කරන්න පුළුවන්.

ඇයි ? සතුට ,සැපය, සොම්නස් බව සපුරාගන්න උත්සහ කළ යුත්තේ, එක් වතාවත් සතුට ,සැපය, සොම්නස උපදවාගෙන ගෙන ස්ථිරව තබා ගන්න නොහැකිද ? බැහැ ඒක වෙනස් වෙලා විපරිණාම වෙලා යනවා. උත්සහ කරලා, එක් වතාවත් උපදවාගෙන ගෙන, ස්ථිරව තබා ගන්න පුළුවන් සැපයක් තියෙනවාද? සත්‍ය වශයෙන්ම ඔව්...........සර්වඥයන් වහන්සේ පිළිබඳ **ශ්‍රද්ධාව මුල් කොට**, පෙන්වා දි වදාළ ආර්‍ය්‍ය ප්‍රතිපදාව අනුගමනය කළ හොත් ස්ථිරවම සැපයේ පිහිටිමට පුළුවන්. ඒ අමා මහ නිවන් සුවයයි.

පෘතග්ජනයන් , අනාර්‍ය්‍යයන් උපදවා ගන්නා සතුට ,සැපය, සොම්නස් බව වෙනස් වෙලා විපරිණාම වෙලා හෙවත් අනිච්ච (අනිත්‍ය) භාවයට පත්වෙනවා, අනිච්ච නම් ඒකාන්තයෙන් දුක්ඛ ධර්මතාවයක්. “යදනිච්චං තං දුකඛනති න විචිකිච්ඡාමි. යදනිච්චං දුකඛං විපරිණාමධම්මං“

සර්වඥයන් වහන්සේගේ ආර්‍ය්‍ය ප්‍රතිපදාව අනුගමනයෙන්,අනාර්‍ය්‍යයන් උපදවා ගන්නා සතුට ,සැපය, සොම්නස, පමණක් නොවේ, සුඛය, ප්‍රිතිය ,විර්යය,මෛත්‍රිය, කරුණාව,ශ්‍රද්ධාව, ප්‍රඥාව,දිට්ඨිය,ද්වේශය,ආදී සියළු සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් දුක්ඛ ධර්මතාවට අයත් දෙයක් බව අවබෝධය තුලින්, ස්ථිරවම සැපයේ පිහිටිමට පුළුවන්.

ඉහත අදහස් වලින් පෙනී යන්නේ **දුක්ඛ ධර්මතාව යනු ආර්‍ය්‍ය නුවනකින් අවබෝධ කළ යුත්තක් බවයි.**

ආර්‍ය්‍ය දේශනාවේ ත්‍රිවිධ දුක්ඛය. දුක්ඛ දුඛය ,විපරිණාම දුක්ඛය, සංස්කාර දුක්ඛය.මෙහි දුක්ඛ දුක්ඛය ,විපරිණාම දුක්ඛය අනාර්‍ය්‍යයන්ටත් සාමාන්‍ය ප්‍රඥාවට අරමුණු වන දුක්ඛ ධර්මතාවකි.සංස්කාර දුක්ඛය යනු ආර්‍ය්‍ය ප්‍රඥාවට අරමුණු වන දුක්ඛ ධර්මතාවකි. සංස්කාර දුක්ඛයට සියළු දුක් අයත් බව සිහිකර ගත යුතුය.

## 1 ආර්ය නුවන ඇති කර ගත හැක්කේ කෙසේද?

*<u>1.සංයුත්ත නිකාය >සගාථ වර්ගය >දේවපුත්ත සංයුත්තං >නානාතිත්ථිය වර්ගය >රෝහිතස්ස සුත්තං</u>*

ගමනේන න පත්තබ්බෝ ලෝකස්සන්තෝ කුදාචනං

න ච අප්පත්වා ලෝකන්තං දුක්ඛා අත්ථි පමෝචනං

කවදාවත් පයින් ගිහිල්ලා නම් මේ ලෝකයේ කෙළවරකට යන්න බෑ. <u>ලෝකෙ</u> කෙළවරකට එන්නෙ නැතුව, දුකින් නිදහස් වීමකුත් නෑ.

## 2 අනාර්යය ලෝකය හා ආර්ය ලෝකය

අනාර්යය ලෝකය පැනවීම අප හොඳින් දන්නා කරුණකි.සෑම භාෂාවකම මෙම අරුත ගෙන දෙන වචන ඇත. සත්ව ලෝකය, තිරිසන් ලෝකය........ආදි ලෙස සිහිකර ගන්න.

ආර්ය ලෝකය පැනවීම

අපි චාහං ආවුසෝ ඉමස්මිඤ්ඤේව බ්‍යාමමත්තේ කලේබරේ සසඤ්ඤිම්හි සමනකේ ලෝකඤ්ච පඤ්ඤාපේමි, ලෝකසමුදයඤ්ච ලෝකනිරෝධඤ්ච ලෝකනිරෝධගාමිනිඤ්ච පටිපදන්ති.

මේ සඤ්ඤා සහිත සිත සහිත වූ *<u>බඹයක් විතර ප්‍රමාණයේ වූ මේ ශරීරයේම තමයි</u>* *ලෝකයත්*, ලෝකයේ හටගැනීමත්, ලෝකයේ නිරෝධ වීමත්, ලෝකය නිරෝධ වීමේ ප්‍රතිපදාවත් තියෙන්නෙ කියලයි මම කියන්නෙ.

## 3 ආර්ය ලෝකයේ කෙළවර කෙසේදයත්?

යත්ථ ඛෝ ආවුසෝ න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති නාහං තං ගමනේන ලෝකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.

*<u>“ආයුෂ්මතුනි, යම් තැනක උපදින්නෙ නැත්නම්, දිරන්නෙ නැත්නම්, මැරෙන්නෙ නැත්නම්, චුත වෙන්නෙ නැත්නම්, යළි උපදින්නෙ නැත්නම්,</u> ඒ ලෝකයේ කෙළවරට පා ගමනින් ගිහින් දැනගන්න, දැකගන්න පුළුවන් කියලා මං කියන්නෙ නෑ.”*

## 4 පනවාගත් ආර්ය ලෝකය ස්වභාව ගුණය- පෙළ දහමින්.

*2.සංයුත්ත නිකාය >සළායතන වර්ගය >සළායතන සංයුත්තං >ගිලාන වර්ගය >ලෝක සුත්තං*

එදා එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට පැමිණුනා ....(පෙ).... එකත්පස්ව වාඩිවුණ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගෙන් මෙකරුණ විමසුවා. ස්වාමීනී, ලෝකය, ලෝකය කියලා කියනවා. **ස්වාමීනී, ලෝකය කියලා කියන්නේ කවර කරුණු මත ද?**

ලුජ්ජතීති ඛෝ භික්ඛු තස්මා ලෝකෝති වුච්චති. කිඤ්ච ලුජ්ජති? චක්ඛුං ඛෝ භික්ඛු ලුජ්ජති. රූපා ලුජ්ජන්ති, චක්ඛුවිඤ්ඤාණං ලුජ්ජති, චක්ඛුසම්ඵස්සෝ ලුජ්ජති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ලුජ්ජති ....(පෙ).... ලුජ්ජතීති ඛෝ භික්ඛු තස්මා ලෝකෝති වුච්චතීති.

**පින්වත් භික්ෂුව, "සිඳී බිඳී යයි" යන අරුතෙන් තමයි ලෝකය කියලා කියන්නේ.** කුමක්ද සිඳී බිඳී යන්නේ? පින්වත් භික්ෂුව, ඇස යි සිඳී බිඳී යන්නේ. රූප යි සිඳී බිඳී යන්නේ. ඇසේ විඤ්ඤාණය යි සිඳී බිඳී යන්නේ. ඇසේ ස්පර්ශය යි සිඳී බිඳී යන්නේ. ඇසේ ස්පර්ශයෙන් උපදින්නා වූ සැප වේවා, දුක් වේවා, දුක්සැප රහිත වේවා යම් විඳීමක් ඇද්ද එය යි සිඳී බිඳී යන්නේ ....(පෙ).... පින්වත් භික්ෂුව, "සිඳී බිඳී යයි" යන අරුතෙන් තමයි ලෝකය

*3.සංයුත්ත නිකාය >සළායතන වර්ගය >සළායතන සංයුත්තං >මිගජාල වර්ගය>සමිද්ධි - ලෝකපඤ්හ සුත්තං*

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස තිබේ නම්, රූප තිබේ නම්, ඇසේ විඤ්ඤාණය තිබේ නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි ලෝකය තිබීම හෝ ලෝක පැණවීම තිබෙන්නේ ....(පෙ).... දිව තිබේ නම්, රස තිබේ නම් ....(පෙ).... මනස තිබේ නම්, මනසට අරමුණු වන දේ තිබේ නම්, මනසේ විඤ්ඤාණය තිබේ නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි ලෝකය තිබීම හෝ ලෝක පැණවීම තිබෙන්නේ.

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස නැත්නම්, රූප නැත්නම්, ඇසේ විඤ්ඤාණය නැත්නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි ලෝකය නැති තැන හෝ ලෝක පැණවීම නොතිබෙන තැන ....(පෙ).... දිව නැත්නම්, රස නැත්නම් ....(පෙ).... මනස නැත්නම්, මනසට අරමුණු වන දේ නැත්නම්, මනසේ විඤ්ඤාණය නැත්නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි ලෝකය නැති තැන හෝ ලෝක පැණවීම නො තිබෙන තැන.

*4.සංයුත්ත නිකාය >නිදාන වර්ගය > අභිසමය සංයුත්තං > ගහපති වර්ගය >දුක්ඛ සූත්‍රය*

දුක්ඛස්ස භික්ඛවේ සමුදයඤ්ච අත්ථංගමඤ්ච දේසිස්සාමි. තං සුණාථ ....(පෙ).... කතමෝ ච භික්ඛවේ දුක්ඛස්ස සමුදයෝ? චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සෝ. ඵස්සපච්චයා වේදනා. වේදනාපච්චයා තණ්හා. අයං ඛෝ භික්ඛවේ දුක්ඛස්ස සමුදයෝ.

“පින්වත් මහණෙනි, දුකේ හටගැනීම ගැනත්, දුකේ නැතිවීම ගැනත් මා ඔබට දේශනා කරන්නම්. එය හොඳින් අසා ගන්න. ....(පෙ)....පින්වත් මහණෙනි, දුකේ හටගැනීම කියන්නේ මොකක්ද? ඇසත්, රූපත් හේතු කොට ගෙන ඇසේ විඤ්ඤාණය උපදිනවා. ඒ තුනේ එකතු වීම ස්පර්ශයයි. ස්පර්ශය හේතු කොට ගෙන විඳීම ඇති වේ. විඳීම හේතු කොට ගෙන තණ්හාව ඇති වේ. පින්වත් මහණෙනි, දුකේ හටගැනීම කියන්නේ මේකටයි.

*5.සංයුත්ත නිකාය >නිදාන වර්ගය > අභිසමය සංයුත්තං > ගහපති වර්ගය >ලෝක සූත්‍රය*

කතමෝ ච භික්ඛවේ ලෝකස්ස සමුදයෝ? චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සෝ. ඵස්සපච්චයා වේදනා. වේදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවෝ. භවපච්චයා ජාති. ජාතිපච්චයා ජරාමරණං සෝකපරිදේවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. අයං ඛෝ භික්ඛවේ ලෝකස්ස සමුදයෝ.

පින්වත් මහණෙනි, ලෝකයේ හටගැනීම කියන්නේ මොකක්ද? ඇසත්, රූපත් හේතු කොට ගෙන ඇසේ විඤ්ඤාණය උපදිනවා. ඒ තුනේ එකතු වීම ස්පර්ශයයි. ස්පර්ශය හේතු කොට ගෙන විඳීම ඇති වේ. විඳීම හේතු කොට ගෙන තණ්හාව ඇති වේ. තණ්හාව හේතු කොට ගෙන උපාදාන ඇති වේ. උපාදාන හේතු කොට ගෙන භවය ඇති වේ. භවය හේතු කොට ගෙන ඉපදීම ඇති වේ. ඉපදීම හේතු කොට ගෙන ජරා මරණ, සෝක, වැළපීම්, කායික දුක්, මානසික දුක්, සුසුම් හෙළීම් හටගන්නවා. ඔය ආකාරයටයි මේ මුළු මහත් දුක් රැසම හටගන්නේ. පින්වත් මහණෙනි, ලෝකයේ හටගැනීම කියන්නේ මේකටයි.

*6.සංයුත්ත නිකාය >සළායතන වර්ගය >සළායතන සංයුත්තං >මිගජාල වර්ගය>සමිද්ධි - දුක්ඛපඤ්හ සුත්තං*

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස තිබේ නම්, රූප තිබේ නම්, ඇසේ විඤ්ඤාණය තිබේ නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි දුක තිබීම හෝ දුක පැණවීම තිබෙන්නේ ....(පෙ).... දිව තිබේ නම්, රස තිබේ නම් ....(පෙ).... මනස තිබේ නම්, මනසට අරමුණු වන

දේ තිබේ නම්, මනසේ විඤ්ඤාණය තිබේ නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි දුක තිබීම හෝ දුක පැණවීම තිබෙන්නේ.

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස නැත්නම්, රූප නැත්නම්, ඇසේ විඤ්ඤාණය නැත්නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි දුක නැති තැන හෝ දුක පැණවීම නොතිබෙන තැන ....(පෙ).... දිව නැත්නම්, රස නැත්නම් ....(පෙ).... මනස නැත්නම්, මනසට අරමුණු වන දේ නැත්නම්, මනසේ විඤ්ඤාණය නැත්නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි දුක නැති තැන හෝ දුක පැණවීම නො තිබෙන තැන.

*7.සංයුත්ත නිකාය >සළායතන වර්ගය >සළායතන සංයුත්තං >මිගජාල වර්ගය>සමිද්ධි - මාරපඤ්හ සුත්තං*

*8.සංයුත්ත නිකාය >සළායතන වර්ගය >සළායතන සංයුත්තං >මිගජාල වර්ගය>සමිද්ධි සත්තපඤ්හ සූත්‍රය*

*9.සංයුත්ත නිකාය >ඛන්ධක වර්ගය >රාධ සංයුත්තං >පඨම මාර වර්ගය>සත්ත සුත්තං*

එකත්පස්ව වාඩිවුණ ආයුෂ්මත් රාධයන් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙකරුණ විමසුවා. “ස්වාමීනි, ‘සත්වයා, සත්වයා’ යැයි කියනවා. ස්වාමීනි, කුමන කරුණු මතද සත්වයායි කියන්නේ?”

“පින්වත් රාධ, රූපය පිළිබඳව යම් කැමැත්තක් තියෙනවා නම්, යම් රාගයක් තියෙනවා නම්, යම් සතුටින් පිළිගැනීමක් තියෙනවා නම්, යම් තණ්හාවක් තියෙනවා නම් ඒ රූපයෙහි ඇලී සිටිනවා නම්, ඒ රූපයෙහි දැඩි ලෙස ඇලී සිටිනවා නම් අන්න ඒ නිසා තමයි ‘සත්වයා’ කියන්නේ. විඳීම පිළිබඳව යම් කැමැත්තක් තියෙනවා නම්, යම් රාගයක් තියෙනවා නම් ....(පෙ).... සඤ්ඤාව පිළිබඳව ....(පෙ).... සංස්කාර පිළිබඳව ....(පෙ).... විඤ්ඤාණය පිළිබඳව යම් කැමැත්තක් තියෙනවා නම්, යම් රාගයක් තියෙනවා නම්, යම් සතුටින් පිළිගැනීමක් තියෙනවා නම්, යම් තණ්හාවක් තියෙනවා නම් ඒ විඤ්ඤාණයෙහි ඇලී සිටිනවා නම්, ඒ විඤ්ඤාණයෙහි දැඩි ලෙස ඇලී සිටිනවා නම් අන්න ඒ නිසා තමයි ‘සත්වයා’ කියන්නේ.

## 5. ඉහත සියළු සූත්‍ර ධර්මයන් ඇසුරින් මූලික ධර්ම මනසිකාරය

<u>ලෝකය/ලෝක සමුදය - දුඛය/දුක්ඛ සමුදය - සත්වත්වය - මාරයා -පංචස්කන්ධය - පටිච්චසමුප්පාදය</u> යන නානාවිධ අර්ථයන් පනවා ඇත්තේ මුලික වශයෙන් *<u>බඹයක් විතර ප්‍රමාණයේ වූ මේ ශරීරයේම  හට ගන්නා</u>* **තෘෂ්ණාව සම්ප්‍රයුක්ත ධර්මතා සමූහයකටය (18).**

රූප + චක්ඛු - චක්ඛුවිඤ්ඤාණ   තිණ්ණං සංඝති  -  ඇසේ උපදින පංචස්කන්ධය

ශබ්ද  + සෝත - සෝතවිඤ්ඤාණ  -තිණ්ණං සංඝති - කණේ උපදින පංචස්කන්ධය

ගන්ධ +ඝාණ - ඝාණවිඤ්ඤාණ  -තිණ්ණං සංඝති - නාසයේ  උපදින පංචස්කන්ධය


රස  +ජිව්හා - ජිව්හාවිඤ්ඤාණ  -තිණ්ණං සංඝති - දිවේ උපදින පංචස්කන්ධය

පොට්ඨබ්බ +කාය -කායවිඤ්ඤාණ  -තිණ්ණං සංඝති - කයේ උපදින පංචස්කන්ධය

ධම්ම  +මන -මනෝවිඤ්ඤාණ   -තිණ්ණං සංඝති - මනසෙහි උපදින පංචස්කන්ධය

සර්වඥයන් වහස්සේ ධර්මතා 18 හි ක්‍රියාකාරී ස්වභාවය පහදා දීම උදෙසා ප්‍රකටවම ව්‍යවහාරික කරන ලද්දේ පංචස්කන්ධ ක්‍රමවේදයයි.

## 6. පංචස්කන්ධ ධර්ම ස්වභාවය




ධර්මතා 18 හි ක්‍රියාකාරී ස්වභාවය පහදා දීම උදෙසා ව්‍යවහාරික කරන විටදී ,හේතුව වෙනම හා ඵලය වෙනම (ලෞකික ක්‍රමය) විස්තර කළ හැකි වුවත්, *ක්‍රියා ස්වභාවය විද්‍යාමාන අවස්ථාවේදී* හේතුව යෙදීමම ඵලය වේ (ලෝකෝත්තර ක්‍රමය) හේතු ඵල වෙන් කළ නොහැක.

# ඛජ්ජනීය සුත්තං (සංස්කාරයන්ගේ ක්‍රියාසාධක ශක්තිය)

කිඤ්ච භික්ඛවේ, රූපං වදේථ? රුප්පතීති ඛෝ භික්ඛවේ, තස්මා රූපන්ති වුච්චති. කේන රුප්පති? සීතේනපි රුප්පති, උණ්හේනපි රුප්පති, ජිඝච්ඡායපි රුප්පති, පිපාසායපි රුප්පති, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සේනපි රුප්පති. රුප්පතීති ඛෝ භික්ඛවේ, තස්මා රූපන්ති වුච්චති.

පින්වත් මහණෙනි, රූපය කියල කියන්නේ මක් නිසාද? පින්වත් මහණෙනි, කිපෙනවා ය යන අරුතින් තමයි රූපය කියල කියන්නේ. <u>(රුප්පත යනු කිපේ, ගැටේ, පෙළයි, බිඳෙයි යන අර්ථයි.)</u> කුමකින්ද කිපෙන්නේ? සීතලෙනුත් කිපෙනවා. උෂ්ණයෙනුත් කිපෙනවා. බඩගින්දරෙනුත් කිපෙනවා. පිපාසයෙනුත් කිපෙනවා. මැසිමදුරු අව්සුළං සර්පයන් ආදී ස්පර්ශයෙනුත් කිපෙනවා. පින්වත් මහණෙනි, කිපෙනවා යන අරුතින් තමයි රූපය කියල කියන්නේ.

කිඤ්ච භික්ඛවේ, වේදනං වදේථ? වේදියතීති ඛෝ භික්ඛවේ, තස්මා වේදනාති වුච්චති. කිඤ්ච වේදියති? සුඛම්පි වේදියති, දුක්ඛම්පි වේදියති, අදුක්ඛමසුඛම්පි වේදියති. වේදියතීති ඛෝ භික්ඛවේ, තස්මා වේදනාති වුච්චති.

පින්වත් මහණෙනි, වේදනාව කියල කියන්නේ මක් නිසාද? පින්වත් මහණෙනි, විඳිනවා ය යන අර්ථයෙන් තමයි වේදනාව කියල කියන්නේ. විඳින්නේ කුමක්ද? සැපත් විඳිනවා. දුකත් විඳිනවා. දුක් සැප රහිත බවත් විඳිනවා. පින්වත් මහණෙනි, විඳිනවා ය යන අර්ථයෙන් තමයි වේදනාව කියල කියන්නේ.

කිඤ්ච භික්ඛවේ, සඤ්ඤං වදේථ? සඤ්ජානාතීති ඛෝ භික්ඛවේ, තස්මා සඤ්ඤාති වුච්චති. කිඤ්ච සඤ්ජානාති? නීලම්පි සඤ්ජානාති, පීතකම්පි සඤ්ජානාති, ලෝහිතකම්පි සඤ්ජානාති, ඕදාතම්පි සඤ්ජානාති. සඤ්ජානාතීති ඛෝ භික්ඛවේ, තස්මා සඤ්ඤාති වුච්චති.

පින්වත් මහණෙනි, සඤ්ඤාව කියල කියන්නේ මක් නිසාද? පින්වත් මහණෙනි, හඳුනා ගන්නවා ය යන අර්ථයෙන් තමයි සඤ්ඤාව කියල කියන්නේ. හඳුනාගන්නේ කුමක්ද? නිල් පැහැයත් හඳුනාගන්නවා. කහ පැහැයත් හඳුනාගන්නවා. රතු පැහැයත් හඳුනාගන්නවා. සුදු පැහැයත් හඳුනාගන්නවා. පින්වත් මහණෙනි, හඳුනා ගන්නවා ය යන අර්ථයෙන් තමයි සඤ්ඤාව කියල කියන්නේ.

කිඤ්ච භික්ඛවේ, සංඛාරේ වදේථ? සංඛතං අභිසංඛරොන්තීති භික්ඛවේ, තස්මා සංඛාරාති වුච්චන්ති. කිඤ්ච සංඛතං අභිසංඛරොන්ති? රූපං රූපත්තාය සංඛතං අභිසංඛරොන්ති, වේදනං වේදනත්තාය සංඛතං අභිසංඛරොන්ති, සඤ්ඤං සඤ්ඤත්තාය සංඛතං අභිසංඛරොන්ති, සංඛාරේ සංඛාරත්තාය සංඛතං අභිසංඛරොන්ති, විඤ්ඤාණං විඤ්ඤාණත්තාය සංඛතං අභිසංඛරොන්ති, සංඛතං අභිසංඛරොන්තීති ඛෝ භික්ඛවේ, තස්මා සංඛාරාති වුච්චන්ති.

පින්වත් මහණෙනි, සංස්කාර කියල කියන්නේ මක් නිසාද? පින්වත් මහණෙනි, හේතුඵල දහමින් සකස් වුණ දෙයක් (සංඛතයක්) නැවත එබඳු දෙයක් පිණිසම විශේෂයෙන් සකස් කරනවා (අභිසංස්කරණය කරනවා) ය යන අර්ථයෙන් තමයි සංස්කාර කියල කියන්නේ. හේතුඵල දහමින් සකස් වුණ කවර දෙයක් නම් විශේෂයෙන් සකස් කරයිද? රූපය රූපයක් පිණිසමයි සංඛතය අභිසංස්කරණය කරන්නේ. වේදනාව වේදනාවක් පිණිසමයි සංඛතය අභිසංස්කරණය කරන්නේ. සඤ්ඤාව සඤ්ඤාවක් පිණිසමයි සංඛතය අභිසංස්කරණය කරන්නේ. සංස්කාර සංස්කාර පිණිසමයි සංඛතය අභිසංස්කරණය කරන්නේ. විඤ්ඤාණය විඤ්ඤාණයක් පිණිසමයි සංඛතය අභිසංස්කරණය කරන්නේ. පින්වත් මහණෙනි, හේතුඵල දහමින් සකස් වුණ දෙයක් (සංඛතයක්) නැවත එබඳු දෙයක් පිණිසම විශේෂයෙන් සකස් කරනවා (අභිසංස්කරණය කරනවා) ය යන අර්ථයෙන් තමයි සංස්කාර කියල.ඉහත ධර්මතා මනා කොට ඇසුරු කර , මනසිකාර කර (දර්ශනඥාණය ඇති කරගෙන) ධර්මතා 18 හි *ක්‍රියා ස්වභාවය විද්‍යාමාන අවස්ථාවේදී* හේතුව යෙදීමම, ඵලය වේ,හේතු ඵල වෙන් කළ නොහැක බව අවබෝධ කර ගැනීමෙන් (ත්‍රිලක්ෂණ අවබෝධය) මේ මොහොතේදීම ,*<u>යම් තැනක උපදින්නෙ නැති, දිරන්නෙ නැති, මැරෙන්නෙ නැති, චුත වෙන්නෙ නැති, යළි උපදින්නෙ නැති,</u> ඒ ලෝකයේ කෙළවරට යා හැකි වබ ඒකාන්ත සත්‍යකි. සතිය හා නුවන ඇති යමෙකුට* ඒ අමා මහ නිවන් සුවය වැඩි ඈතක නොවේ.

## සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

නිවන් මග උදෙසා දර්ශන ඥාණය

**Join Zoom Meeting** (සෑම සිකුරාදාම සවස 6.00 - 8.00 දක්වා)

**Meeting ID: 842 2639 0602    Passcode: 100100**

**Youtube: Way To Nibbana    WEB SITE : www.waytoni.com**